# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1291 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2023 திகதி

දිනය / Date – 12/10/2023 පැය 1735

## මාධ්‍ය නිවේදනය

**01. මෙරට නිෂ්පාදිත ගිණි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කල්තොට පොලිස් ස්ථානය.**

2023.10.12 වන අද දින උදෑසන කාලයේ කල්තොට පොලිස් වසමේ නෙළුයාය ප්‍රදේශයේදී කල්තොට පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වූ කොටවෙහෙර මංකඩ, බලංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කල්තොට පොලිසිය වැඩිදුර විමර්ශන කටයුතු පවත්වාගෙන යනු ලබයි.

**02. විදේශ රටක නිෂ්පාදිත ගිණි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඉගිණියාගල පොලිස් ස්ථානය.**

2023.10.12 වන අද දින දහවල් කාලයේ ඉගිණියාගල පොලිස් වසමේ 04 වන පාලම ප්‍රදේශයේදී ඉගිණියාගල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව විදේශ රටක නිෂ්පාදිත බෝර 12 ගිනි අවියක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වූ මොරගහපල්ලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඉගිණියාගල පොලිසිය වැඩිදුර විමර්ශන කටයුතු පවත්වාගෙන යනු ලබයි.

**03. විදේශ රටක නිෂ්පාදිත ගිණි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මාරවිල පොලිස් ස්ථානය.**

2023.10.11 වන දින දහවල් කාලයේ මාරවිල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර එම ප්‍රදේශයේ නිවසක සඟවා තිබූ **බලපත්‍ර**

**නොමැතිව විදේශ රටක නිෂ්පාදිත බෝර 12 ගිනි අවියක් හා සජීව පතරොම් 80 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 61 ක් වූ නාත්තන්ඩිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මාරවිල පොලිසිය වැඩිදුර විමර්ශන කටයුතු පවත්වාගෙන යනු ලබයි.

**04. බඹර ප්‍රහාරයකට ලක් වී ළමුන් පිරිසක් තුවාල ලැබීම - පොත්තපිටිය පොලිස් ස්ථානය.**

2023.10.12 වන අද දින උදෑසන කාලයේ පොත්තපිටිය පොලිස් වසමේ පාසලක අඹ ගසක තබූ බඹර කූඩුවක් ඇවිස්සීම හේතුවෙන් පාසල් ළමුන් 46 දෙනෙකු තුවාල ලබා කැටපිටිය, කඩුගන්නාව හා පේරාදෙණිය යන රෝහල්වලට ඇතුලත් කර ඇති බවට ලද තොරතුරක් අනුව පොත්තපිටිය පොලීසිය විමර්ශනයක් ආරම්භ කර ඇත.

**බඹර ප්‍රහාරයට ලක් වූ ළමුන් වයස අවුරුදු 05 ත් 10 ත් අතර වයස් වල පසු වේ.**

පොත්තපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන කටයුතු පවත්වාගෙන යනු ලබයි.

**05. සොරකමකට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට - අත්තනගල්ල පොලිස් ස්ථානය**

අත්තනගල්ල පොලිස් වසමේ 2023.09.29 වන දින පූජා භාණ්ඩ අලෙවිසැලක් බිඳ රුපියල් 4 707,500/- ක් වටිනා දේපල සොරකම් කිරීමක් සම්බන්ධයෙන් ලද පැමිණිල්ලකට අනුව අත්තනගල්ල පොලිසිය විමර්ශනයක් ආරම්භ කර ඇති අතර හම්බන්තොට ප්‍රදේශයේදී විමර්ශනයට අදාලව වැටලීමක් සිදුකර 2023.10.11 වන දින සැකකරුවන් දෙදෙනෙකු හා අපරාධයට යොදාගත් බවට සැකකරන වෑන් රථයක්ද අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 38 හා 34 වයස් වල පසුවන පානදුර ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෙම සැකකරුවන් අත්තනගල්ල, බණ්ඩාරගම, මීගොඩ, මීගහවත්ත, පොලිස් වසම්වලද මෙවැනි සොරකම් සිදු කර ඇති බවටද දැනට සිදුකරන ලද විමර්ශන වලදී අනාවරණයවී ඇත. අත්තනගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන කටයුතු පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**